*** කක්කල් කැස්ස * ගලපටලය * පිටගැස්ම**

# ඔබේ දරුවා රැකගන්න ගත යුතු පියවර මෙන්න

## වනිතා ලතා

අවුරුදු පතා ජන සමාජයේ සෑම තරාතිරමකටම අයත් දරුවන්ගෙන් විශාල සංඛ්‍යාවක් බිලි ගනු ලබන රෝග වලින් ඔබේ ළදරුවා ආරක්ෂා කර ගැනීම ඔබගේ පරම යුතුකමෙකි. ඒ සඳහා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව නිරතුරුව ඔබේ සහායට සිටියි.

**කක්කල් කැස්ස**

වයසින් අවුරුද්දකට අඩු ළමයින්ගේ මාරක සතුරා වන කක්කල් කැස්ස ප්‍රතිශක්තිකරණයේ ආධාරයෙන් වළක්වා ගත හැකි ය.

**ගලපටලය**

ආරක්ෂාව ලබා දී නැත්නම් ගලපටලය එකල මෙන් ම මෙකල ද භයානක උවදුරකි. නමුත් ප්‍රතිශක්තිකරණයේ ආධාරයෙන් මේ රෝගය වළක්වා ගත හැකි වී තිබේ.

**පිටගැස්ම.**

ලොකු කුඩා කවර තුවාලයකට හෝ නොදැනුවත්වම ඇතුළු වන විෂ බීජ නිසා වැළඳෙන පිටගැස්ම ප්‍රතිශක්තිකරණය නිසා දැන් සාර්ථක ලෙස වළක්වා ගත හැකි ය.

ඔබගේ සෞඛ්‍ය මධ්‍යස්ථානය මගින් නොමිලයේ කරනු ලබන ප්‍රතිශක්තිකරණය ලබා ගත් විට මේ මාරක ළමා රෝගයන්ට ඔබට හෝ ඔබේ ළමයින්ට අනතුරු පැමිණිවිය නොහැකි ය. එය ලබා නො ගත හොත් රෝගය ඔබේ ගෙදරට ද පැමිණෙනු ඇත. ඒ ගැන කිසිම අඩමානයක් නැත.

**කක්කල් කැස්ස**

මෙය ළමයින්ට වැළඳෙන බරපතල රෝගයකි වයස 5 ට අඩු ළමයින් බොහෝ සෙයින් මේ රෝගයට ගොදුරු වීමට ඉඩ ඇත. වැඩිහිටි අයට වඩා ළදරුවන්ට හා බාල ළමුන්ට මේ රෝගය වැළඳේ.

**රෝග ලක්ෂණ**

කක්කල් කැස්ස ද පටන් ගන්නේ සාමාන්‍ය හෙම්බිරිස්සාවක දී මෙන් නාසයෙන් හා ඇස්වලින් සොටු සහ කඳුළු ගැලීමෙනි. ඉන් පසුව තරමක් වේදනා දෙන වියළි කැස්ස හට ගනී. බොහෝ වේලා වක් පවතින මෙම කැස්ස පළමු වෙන් වරින් වර ඇති වුව ද, පසු වන විට නිතර නිතර ඇති වීමට පටන් ගනී. ඇතැම් අවස්ථාවල දී කසින විට ළමයාට හුස්ම ගැනීමට පවා අපහසු වේ. දිගටම පැවති කැස්ස නැවතෙනවාත් සමඟම ගනු ලබන හුස්ම වාර තදින් කෙරෙන බැවින් ශබ්දයක් හට ගනී. කැස්ස ඇති වූ විට රෝගියාගේ මුහුණ රතු වීමත් ඇස් රතු වී කඳුළු ගැලීමත් සිදු වේ. කැස්ස අවසානයේ දී බොහෝ විට වමනය ඇති වේ. කැස්සේ ඇදුම සති 4 සිට 6 දක්වා පවතී.

**රෝගය පැතිර යාම**

කක්කල් කැස්ස විෂ බීජය රෝගීන්ගේ නාසයෙන් හා උගුරෙන් පිට වන සෙම් සොටු සමඟ පවතී. රෝගය වැළඳුන තැනැත්තකු ඇසුරු කිරීම නිසා අන් අයට ද බෝ වන බැවින් නිරෝගී ළමයින්, කැස්සෙන් පෙළෙන ළමයින් කෙරෙන් ඈත් කර තැබිය යුතු ය. එසේ ම රෝගීන්ගේ මළ, මුත්‍ර හා සෙම් සොටු වලින් අළුතින් ම අපවිත්‍ර වූ ද්‍රව්‍ය මගින් ද රෝගය බෝ වන බැවින් ඒවා කෙරෙන් ද ළමයින් ඈත් කළයුතු ය.

**ආරක්ෂාව**

ආරක්ෂක බෙහෙතත් ශරීරයට විදීමෙන් ඔබේ ළමයා ආරක්ෂා කළ හැකි ය. මෙම එන්නත කක්කල් කැස්ස සඳහා පමණක් හෝ කක්කල් කැස්ස ගලපටලය හා පිටගැස්ම යන රෝග තුනම එකවර වැළැක්වීම සඳහා ත්‍රිත්ව එන්නතක් ලෙස ද ගත හැකි ය.

### ගලපටලය

ගලපටලය ඔබේ ළදරුවාට බෝ නොවිය යුතුම රෝගයකි. එහෙත් ප්‍රතිශක්තිකරණය මගින් ආරක්‍ෂාකර නැත්නම් එය ඔහුට වැළඳීමට පුළුවන. ලංකාවේ මේ රෝගය නිසා ළමයින් බොහෝ දෙනෙක් අවුරුදු පතා මිය යති.

### රෝග ලක්‍ෂණ

ගලපටලය බෝ වන රෝගයකි. එය පැතිර යන්නේ විෂ බීජ මගිනි. සාමාන්‍යයෙන් රෝගය ඇති වන්නේ උගුරේ ය. උගුරේ මතු පිට පටක වලට රෝගය සංක්‍රමණය වීම නිසා ඒවා කළු මිශ්‍ර සුදු පාට හෝ කහ පාට වේ. සාමාන්‍යයෙන් මේ සමඟ ම උගුර වණ වීම ද ඇති වේ. පටක ඉදිමීම හේතු කොට ගෙන ආශ්වාස ප්‍රාශ්වාස මාර්ග ඇසිරීම නිසා හුස්ම ගැනීම වළකී. මේ විෂ බීජ මගින් හෘදය, ස්නායු සහ වකුගඩු වලට හානි කර වූ විෂ වර්ගයක් නිපදවනු ලබන බැවින්, එම ඉන්ද්‍රියයනට අනතුරු පැමිණීම නිසා මරණය සිදු වීමට ද පුළුවන.

### රෝග පැතිර යාම

රෝගය වැළඳුන තැනැත්තා ගේ නාසයෙන් හා උගුරෙන් පිට වන සෙම් සොටු නිසා ගලපටලය පැතිර යයි. පවුලේ අසල්වාසීන් අතර හා පාසලේ සිසුන් අතර සිටින ආරක්‍ෂා රහිත ගලපටල වාහක යන් නිසා ද රෝගය පැතිර යාමට ඉඩ තිබේ. සාමාන්‍යයෙන් මෙම රෝගයට ළදරුවෝ හා කුඩා ළමෝ ගොදුරු වෙති.

### ආරක්ෂාව

ගලපටලය රෝගයෙන් වැළකිය හැක්කේ ප්‍රතිශක්තිකරණයේ මාර්ගයෙනි. ඔබේ ළමයාට මේ එන්නතෙන් පළමු වේල මාස දෙකේ දීත්, දෙවැනි වේල ඉන් මාසයකින් පසුවත් තෙවැනි වේල තවත් මසකට පසුවත් දිය යුතු ය. ඔබට මේ කටයුතු සියල්ලම ළඟම පිහිටි සෞඛ්‍යය මධ්‍යස්ථානය මගින් කරවා ගත හැකි ය.

### පිටගැස්ම

පිටගැස්ම යන නාමය පවා බොහෝ මව් පියන් බිය වද්දන සුළු එකක් බැවින්, දන් මෙම රෝගයට නොවරදින ආරක්‍ෂක ක්‍රමයක් තිබීම ගැන ඔවුහු කෘතඥ වෙති. එහෙත් පුදුමයට කාරණය නම් වැඩ වරද්ද ගන්නා තුරුම ආරක්‍ෂක බෙහෙත් ගැනීම පැහැර හරින දෙමව්පියන් විශාල සංඛ්‍යාවක් සිටීම යි.

### රෝග ලක්ෂණ

පිටගැස්ම වනාහී, එක්තරා විශේෂ විෂ බීජයකින් පිට කරන විෂ හේතු කොට ස්නායු පද්ධතියේ ඇති වන තියුණු වේදනා සහිත ප්‍රකෝපයකි. මේ විෂ බීජ ශරීරයේ තුවාල වූ තැනක වැඩෙමින් එතැනින් ම ශරීර ගත වෙති. ශරීර ගත වූ මේ විෂ බීජ වලින් නිකුත් කරන විෂ, රුධිර නාල මගින් මොළය ඇතුළු ස්නායු පද්ධතිය කරා යැමෙන් අතිශය වේදනා ඇති වන මස් පිඩු හැකිළීම හා තදවීම ද ඇති කරයි.

### රෝගය පැතිර යාම

ගව, අශ්ව, කුකුළු හා වෙනත් සතුන් ගේ බඩවැල් තුළ තිබිය හැකි පිටගැස්ම විෂ බීජ ඔවුන් ගේ මළ සමඟ පිට වේ. විෂ බීජ සංක්‍රමණය වීමත්, ශරීර ගත වීමත් සිදු වන්නේ විෂ බීජ මිශ්‍ර පස් තුවාල වලට වැටෙන්ට ඉඩ හැරීමෙනි. වැඩි ප්‍රවේසමක් නැතිව දූව පැන සෙල්ලම් කරන ළමයින්ට වැඩියෙන් ම මේ රෝගය බෝ වීමට ඉඩ තිබේ.

### ආරක්ෂාව

මේ රෝගය වැළැක්වීම සුදුසුම ක්‍රමය නම් නවීන ප්‍රතිශක්තිකරණය යි. නොහොත් ආරක්‍ෂා බෙහෙත් විද්දවා ගැනීම යි. එහෙයින් රෝගය වැළඳීමට ඉඩ ඇති සියළු දෙනම ආරක්‍ෂිත බෙහෙත් විද්දවා ගැනීම ඉතා අවශ්‍ය ය. ළදරුවන් හා කුඩා ළමුන්ට විශේෂයෙන් ම මේ ආරක්‍ෂාව සැලසිය යුතු ය. කක්කල් කැස්ස හෝ ගලපටලය හෝ ඒ දෙකමත් වළක්වන බෙහෙත් සමඟ ම පිටගැස්ම ආරක්‍ෂා බෙහෙත ද එන්නත් කිරීම වඩාත් ම සුදුසු ය.

### තුන්වරක් බෙහෙත් විදීමෙන් පමණක් දන් රෝග තුනක්ම වැළැක්විය හැකි ය

මුලින් කියවන ලද කරුණු වලින් එක් එක් රෝගය වැළැක්වීමට හැකි එන්නතක් ද රෝග තුනම එකවරවැළැක්විය හැකි ඒකාබද්ධ එන්නතක් ද තිබෙන බව ඔබට පෙනී යන්ට ඇත. එයින් වේදනාව අඩු වේ. නැවත නැවත බෙහෙත් විදීමට පැමිණීම වළකී. ඒ සැමට ම වඩා එයින් මාරක රෝග තුනක් ම වළක්වාලයි.

ඔබේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී වරයා මහ ජන සෞඛ්‍ය සාත්තු සේවිකාව, හෝ මහජන සෞඛ්‍ය පරීක්‍ෂක වරයා හමු වී ප්‍රතිශක්තිකරණය කෙරෙන සථානය හා දිනය දැන ගෙන ප්‍රමාද නොවී ඔබේ ළමයා ආරක්‍ෂා කර ගන්න.

(සෞඛ්‍යය දෙපාර්තමේන්තුවේ සෞඛ්‍ය අධ්‍යාපන අංශයේ අනුග්‍රහයෙනි.)